# 05

# බුත්සරණේ නිපාත යෝජනය

නිල්මිණී දයානන්ද[1]

## Abstract

***Buthsarana is considerd as the incomparable Sinhalese prose. It was written by Vidyachakravarthi at the end of 12th century or at the beginning of 13th century A.D.***

***Buthsarana reflects a fully developed stage of Sinhalese language and literature. By the time when Buthsarana was written the Sinhalese language had developed with some characteristics peculiar to it alone. The extent of the evolution of the syntax during the period from the 10th century A.D. to the 13th century A.D. is remarkably significant when we compare the changes that took place in the subsequent period that is until about the 18th century A.D.***

***Many prepositions which are used at present are included in Buthsarana. Prepositions with one meaning as well as prepositions with different meanings can be seen in this book.***

***Many Prepositions in Buthsarana are used in same meanings even today but some prepositions are used in different meanings. In addition to that some prepositions in Buthsarana are not used at present. It reveals that some prepositions and some meanings of prepositions which were used in 12th and 13th centuries have been demonetized in the subsequent period.***

***As a whole it is clear almost all the prepositions have been established in Sinhala language by the time when Buthsarana was written.***

## හැඳින්වීම

මෙය මා විසින් සිදු කරන ලද **බුත්සරණේ** වාක්‍ය විචාරාත්මක අධ්‍යයනයක් පදනම් කරගත් පර්යේෂණාත්මක ලිපියකි. මෙහිදී 'නිපාත' නිර්වචනය කිරීමෙන් අනතුරුව **බුත්සරණේ** අන්තර්ගත නිපාත විවිධ ප්‍රභේද යටතේ

[1] *නිල්මිණී දයානන්ද, කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, nil_daya@yahoo.com*

වර්ගීකරණය කොට, වාක්‍ය සංස්ථිතිය තුළ එහි ක්‍රියාකාරීත්වය පැහැදිලි කොට ඇත.

එසේම මෙහිදී වර්තමානයේ භාවිත වන නිපාත හා **බුත්සරණේ** අන්තර්ගත නිපාත සංසන්දනය කොට තිබේ. යථෝක්ත කරුණු ඇසුරින් එළඹි නිගමන ඉන් අනතුරුව සඳහන් කොට ඇත.

### ක්‍රමවේදය

මෙය සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණවේදීන්ගේ සහ නූතන වාග්වේදීන්ගේ මූලධර්මවල සංකලනයෙන් සිදු කරන ලද විශ්ලේෂණයකි. මෙවැනි සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හැදෑරීමට සුදුසුම සැලැස්ම වන්නේ එයයි.

මෙම වාක්‍ය විචාරාත්මක අධ්‍යයනය සඳහා භාවිත කොට ඇත්තේ **බුත්සරණේ** ලබුගම ලඞ්කානන්ද සංස්කරණයයි. මෙම ලිපියේ අන්තර්ගත බොහෝ පාරිභාෂික පද දක්වා ඇත්තේ සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාවේ දේශන අනුසාරයෙනි.

### බුත්සරණේ නිපාත යෝජනය

දොළොස්වන ශතවර්ෂයේ අග භාගයේදී හෝ දහතුන්වන ශතවර්ෂයේ මුල් භාගයේදී හෝ විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද **බුත්සරණ**, සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයේ මුදුන් මල්කඩ වශයෙන් සැලකේ.

**බුත්සරණ** තුළින් පිළිබිඹු වන්නේ සිංහල ගද්‍යයේ අතිශයින් දියුණු වකවානුවකි. මේ වන විට සිංහල භාෂාව ඊට ආවේණික ලක්ෂණ සහිතව ප්‍රවර්ධනය වී තිබිණ. මෙකල සිදු වූ භාෂා පරිණාමය ඉන් පසු අවධියේදී (දහඅටවන සියවස දක්වා) සිදු වූ භාෂා පරිණාමයට සාපේක්ෂව වාක්‍ය විචාරය සම්බන්ධයෙන් සුවිශේෂී වැදගත්කමක් දරයි. (විජේමාන්න, 1984: iii).

**බුත්සරණෙහි** අන්තර්ගත නිපාත තුළින් සිංහල නිපාත විකාශනයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් වී තිබේ. නිපාත අයත් වන්නේ අව්‍ය පද ගණයටයි. අව්‍ය පද යනු පූර්ණ වරනැගීම්වලට යොමු නොවන පදයි. (කරුණාතිලක, 2003: 220) සිංහල භාෂාවේ පවතින අනෙක් අව්‍ය පද විශේෂය 'උපසර්ග' යනුවෙන් හැඳින්වේ. (කුමාරතුංග සහ ගුණවඩු, 1965: 115)

නිපාත තුළින් ඉටුවන කාර්යභාරය අනුව ඒවා විවිධ ප්‍රභේද යටතේ වර්ගීකරණය කොට දැක්විය හැකිය.

යමක් තවත් දෙයකට සමාන කොට දැක්වීම සඳහා යොදාගනු ලබන නිපාත 'තුල්‍යාර්ථයේ නිපාත' නම් වේ. 'මෙන්', 'සෙ', 'සෙයින්', 'වැනි', 'බඳු' හා 'ලෙසින්' ආදී නිපාත තුල්‍යාර්ථයෙහි යෙදේ. මෙබඳු උපමාවාචක නිපාතවලට පෙර යෙදෙන නාම පද අනුක්ත රූප ගනී.

උදා:

- "... දෙරෑ දෙරෑ නැඟි සඳක් <u>සෙ</u>, ... මරුකතරෙහි දුටු මහවිලක් <u>සෙ</u>, ...." (4)
- "(නරකයෙහි උපදනො) වවුලන් <u>මෙන්</u> සක්වළගලැ නියෙන් එලීගෙනැ හොවිති." (56)
- "... සසර සහමුලින් දවු සර්‍වඥ වියතාණන් <u>වැනි</u> ගුරුන් ලදිමි, ...." (276)

තුල්‍යාර්ථයේ නිපාත අතුරින් 'සේ', 'ලෙස' යන නිපාත පූර්ණ වශයෙන් විභක්තිවල වර නොනැඟුණද විභක්ති කිහිපයක වර නැගේ. කිසියම් නිපාතයක් එසේ වරනැගේද එහි නාම පද කර්තව්‍යයක් පවතී.

උදා:

- "... මියුරු කෙළිනළු ... ගවර වළෙහි හුණු පණු කැලන් <u>සෙයින්</u>, අපිස් වැ හැරෑ ...." (3)
- "... නාසයෙහි සොටු <u>ලෙසින්</u> සිටි අසූචි යැ, දත්හි මැලි <u>ලෙසින්</u> සිටි අසුචි යැ, ...." (30)

එසේම 'සෙ' යන නිපාතය 'ආකාරය' යන අර්ථයෙන්ද **බුත්සරණෙහි** යෙදී ඇත.

උදා:

- "... ආළවකය, පවනින් බුදුන් සොල්වාපී <u>සෙ</u> ඉතා යහපත, ...." (148)

යමක් සිදු කරනු ලබන්නේ කුමන අරමුණකින්ද? යන්න දැක්වීම සඳහා යෙදෙන නිපාත පද 'පිණිසාර්ථයේ නිපාත' නම් වේ. 'පිණිස', 'සඳහා' ආදී නිපාත මේ පිළිබඳ නිදසුන්ය.

උදා:

- "... රජගහනුවර සිටාණො උපද්‍රව දුරු කරනු <u>පිණිස</u> හා ප්‍රමාදයෙන් වැටී හුණු ආභරණාදිය. රක්ෂා කරනු <u>පිණිස</u> හා සිසාරා දැල් බැඳ ජල ක්‍රීඩා කෙළනා හ." (92)
- "... මතු බුදුවන මහතාණො සියලු ලොවැස්සන් සසරින් මුදනු <u>සඳහා</u> දෙව්ලොවින් සැවැ අවුත් ... වුසති දෙවීන් බඩැ පිළිසිඳැ ගත්හ." (317)
- "... වස්තු <u>සඳහා</u> ආයෙම් නො වෙමි, ... බලාපියනු <u>සඳහා</u> ආමි ...." (340)

පිණිසාර්ථයේ නිපාත බොහෝ විට යෙදෙනුයේ නාම පදවලට පරවය. මෙහිදී ක්‍රියා නාමද ඒ ගණයට අයත් වේ.

යම් කෙනෙක් හෝ යම් දෙයක් හෝ අවධාරණයෙන් යුතුව වෙන් කොට දැක්වීම සඳහා 'නිශ්චයාර්ථයේ නිපාත' භාවිත වේ. 'හැරෑ', 'මුත්' ආදී නිපාත මේ පිළිබඳ නිදසුන්ය.

උදා:

- "මෙසෙ වහා සමවත් සමවදනට බුදුන් වහන්සෙ හැර ඔබ මුත් ... කිසි වහන්සෙ කෙනෙකුන්දැටත් නොපිළිවන." (90)
- "... උදය පර්වතයෙහි මුත් වින්ධ්‍යාපර්වතයෙහි හිරු උදයක් නැත්තා සෙ, මා ගෙ මතයෙහි මුත් තා ගෙ මතයෙහි නිර්වාණයෙක් නැත, ...." (130)
- "... සසරින් එතෙරවන්නට මෙ මැ දහම් හැර අනෙක් උපායෙක් නැත." (154)

නිශ්චයාර්ථයේ නිපාතවලට පෙර යෙදෙනුයේ නාම පදයි. මෙම නිපාත මගින් යමක සීමාව දක්වනු ලැබේ. යමක් ආරම්භ වන සීමාව දක්වන නිපාත 'පූර්ව සීමා නිපාත' යනුවෙන්ද, යමක් අවසාන වන සීමාව දක්වන නිපාත 'අපර සීමා නිපාත' යනුවෙන්ද හැඳින්වේ. 'පටන්' සහ 'සිටැ' යන නිපාත පූර්ව සීමා නිපාත වන අතර 'තෙක්', 'දක්වා' සහ 'තුරු' ආදී නිපාත අපර සීමා නිපාත වේ. මේ අතුරින් 'තෙක්' යන නිපාතයට අපර සීමාව අයත් වන අතර, 'දක්වා' යන නිපාතයට අපර සීමාව අයත් නොවේ.

උදා:

- "... මෙ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා නුඹ සරණ යම්හ ...." (39)
- "... උන් වලැ සිටැ නො එන තුරු ගොස් දරුවන් ඉල්ලා ගනිමී ...." (342)
- "මා එන තෙක් නුඹ ගෙ දරුවන් දෙදෙනා කෙරෙහි බියපත් වුව මැනැව, ...." (342)

මෙහිදී 'පටන්', 'සිට', 'දක්වා' යන නිපාතවලට පෙර නාම පදද, 'තෙක්', 'තුරු' යන නිපාතවලට පෙර වර්තමාන කෘදන්තද යෙදේ.

යම් දෙයකට හේතු දැක්වීම සඳහා යෙදෙන නිපාත 'සාධකාර්ථයෙහි නිපාත' නම් වේ.

උදා:

- "... දඩ ගිය රජ්ජුරුවන් නිසා දර ගෙනෙන මිඩිය කුසැ පිළිසිඳගෙනැ ...." (8)
- "... ඔහු දළ මහත් හෙයින් කපාගත නොහෙත්; ...." (18)
- "... බුදුරජාණන් වහන්සෙ එක් සමයෙක්හි සැවැත්නුවර නිසා ජෙතවන මහා විහාරයෙහි වැඩැවසන සේක." (85)

මෙහි පළමු වැකියේ 'නිසා' යන නිපාතය සාධකාර්ථයෙහි යෙදී ඇත. එහෙත් අවසන් වැකියෙහි එම නිපාතය යෙදී ඇත්තේ 'ඇසුරුකොටගෙන' යන අර්ථයෙනි. එහෙත් පසු කාලයේදී මෙම අර්ථය අභාවයට ගොස් ඇත.

'නැත' යන අර්ථය ප්‍රකාශ කරනු ලබන නිපාත 'නිෂේධාර්ථයේ නිපාත' යනුවෙන් හැඳින්වේ. මෙම ගණයට අයත් වෙන්නේ 'න', 'නු' හා 'නො' යන නිපාතයි.

උදා:

- "... රජ්ජුරුවො ... එ උපද්‍රව සන්හිඳුවා-ගත නුහුණුහාහ." (169)
- "... කිසි නොගුණයක් නැති හෙයින් නුගුණයකට දුගී වූ ...." (309)
- "... තී විසින් පවු කරන ලද්දෙ නොවෙයි, මට අප්‍රිය ද නොවෙයි, ...." (316)

'නො' නිපාතය ක්‍රියා පදයකට පෙරද, 'නු' නිපාතය ක්‍රියා පදයකට හෝ නාම පදයකට පෙරද යෙදේ. තවද මෙම නිපාත යෙදෙනුයේ නාම පද හා ක්‍රියා පද සමඟම වීමද විශේෂත්වයකි.

විභක්ති අර්ථ ප්‍රකාශ කිරීම සඳහා යොදනු ලබන නිපාත 'විභක්ත්‍යර්ථයේ නිපාත' නම් වේ. 'විසින්' යන නිපාතය කර්තෘ විභක්තියෙහි යෙදේ.
උදා:

- "... කුම්භාණ්ඩයන් විසින් පිරිවරන ලද අභ්‍යන්තර නම් අඹගසෙකුදු ඇති ...." (50)
- "... වංශකාරයන් විසින් පිඹිනා ලද වංශනාදයෙන් මනොහර යැ." (162)

සම්ප්‍රදාන විභක්තියෙහි යෙදෙනුයේ 'ට' සහ 'හට' යන නිපාතයි. පහත දැක්වෙන්නේ ඊට නිදසුන් කිහිපයකි.
උදා:

- "... ජාත්‍යන්ධයනට ඇස් දුන්හ. ... බිහිරනට කන් දුන්හ." (172)
- "සර්‍වඥයන් වහන්සෙ එ සමයෙහි මණ්ඩුක දිව්‍යපුත්‍රයා හට බණ වදාළ සේකැ." (217)

'කෙරෙන්', 'ගෙන්' ආදී නිපාත අවධි විභක්තියට අයත් වේ. මෙම නිපාත **බුත්සරණෙහි** යෙදී ඇත්තේ මෙලෙසිනි.
උදා:

- "... නුඹ ගෙන් කන්කලු බස් ඇසූ හෙයින් කන් ලද්දමෝ නම් ඇපි යැ, ...." (39)
- "... බුදු කෙනෙකුන් කෙරෙන් සද්ධර්‍මය ද අසන්නට ලබන්නෙහි, ...." (131)

සම්බන්ධ විභක්තියෙහි යෙදෙනුයේ 'ගෙ' යන නිපාතයයි. මෙම නිපාතය නාම පදවලට පරව යෙදී තිබේ.

උදා:

- "මුවන් ගෙ හඟින් දිවියන් ගෙ කර කැස්වූහ." (172)
- "... තාරකාවන් ගේ පැළැඹීම බොහෝ වූ කල්හි, ...." (120)

ආධාර විභක්තියෙහි යෙදෙනුයේ 'කෙරෙහි' යන නිපාතයයි. මෙම නිපාතය යෙදී ඇත්තේද නාම පදවලට පරවය.
උදා:

- "... රජ්ජුරුවන් <u>කෙරෙහි</u> කෙළෙහි ගුණ දනැ, ...." (9)
- "... නුවණැත්තන් <u>කෙරෙහි</u> අගතන්හි තබන ලද, අස්සජි මහ තෙරුන් වහන්සෙ ...." (191)

'විකල්පාර්ථයේ නිපාත' යනු යමක් සඳහා පවතින ආදේශකයන් දැක්වීම පිණිස යෙදෙන නිපාතයි. 'හෝ' සහ 'නොහොත්' යන නිපාත මේ සඳහා භාවිත වේ.
උදා:

- "... බඹ ලොව්හි ජරාවට පැමිණෙන කෙනෙක් <u>හො</u> මියැ යන මහලු වන කෙනෙක් <u>හෝ</u> නැත, ...." (204)
- "... සෙස්සො කුඳු <u>හො</u> වෙති, කුරු <u>හො</u> වෙති." (250)
- "... අනන්තජාතියෙහි බුදු-පසේ බුදු-මහ රහතුන් දුටු කල්හි වැඳ බිමැ ගහා නො විඩා වූ නළල මෙසෙ වන බව ඉතා සුදුසු මැ යැ. <u>නොහොත්</u> බුදුන් වහන්සෙ ගෙ සිරස පිරිහුන් දියබුබුළක් සෙ සම වට වැ තිබෙන්නෙ යැ, ...." (258)

නාම පදයකට හෝ ක්‍රියා පදයකට පරව 'හෝ' නිපාතය යෙදී ඇත. 'හො' නිපාතයෙන් සම්බන්ධ වන සියලු විකල්පයන් එකම වැකිය තුළ යෙදී ඇති ආකාරය ඉහත පළමුවන වැකිය තුළින් පැහැදිලි වේ. ඇතැම් විට 'හො' නිපාතයෙන් දැක්වෙන විකල්පයන් සඳහා **බුත්සරණෙහි** උපවාක්‍යද යෙදී ඇත. ඉහත තෙවන හා සිවුවන වැකි මේ පිළිබඳ නිදසුන් වේ. මීට අමතරව 'නොහොත්' යන නිපාතය වාක්‍ය මුල යෙදී තිබීමද මෙම භාෂා රටාවේ විශේෂත්වයකි. ඉහත අවසන් වැකිය මෙබන්දකි.

'අවස්වීකාර්ථයෙහි නිපාත' යනු යම්කිසි අවිනිශ්චිත බවක් ප්‍රකාශ කිරීම සඳහා යොදනු ලබන නිපාතයි. 'හොත්' සහ 'නම්' යන නිපාත මේ පිළිබඳ නිදසුන් වේ.
උදා:

- "... සෙට ශ්‍රමණ ගෞතමයන් <u>මැරුවහොත්</u> රජ්ජුරුවන් ගෙ සේසත තබා ඉතිරි කැමතියක් ඉල්ලා දෙම්හ; ...." (67)
- "... ශ්‍රමණ ගෞතමයො පූජාවට රැස් වූ මහා ජනයා මධ්‍යයෙහි ඍද්ධිප්‍රාතිහාර්ය කළෝ <u>නම්</u> එ මහා ජනයා අප කෙරෙ සරු නැති වැ යන්නාහ ...." (126)
- "... ඇපි දු ඉදින් ධූමයක් හළමො <u>නම්</u> මෙ නාගරාජයා තබා මුළු ලොව මැ ඉවසාගත නොහෙන්නෙ යැ, ...." (123)
- "... ශ්‍රමණ ගෞතමයො පූජාවට රැස් වූ මහා ජනයා මධ්‍යයෙහි ඍද්ධිප්‍රාතිහාර්ය කළෝ <u>නම්</u> එ මහා ජනයා අප කෙරෙ සරු නැති වැ යන්නාහ ...." (126)

ඉහත සෑම වැකියකම ප්‍රධාන වාක්‍යයක් සහ උපවාක්‍යයක් පවතී. ඒවායේ උක්ත පද සහ ආඛ්‍යාත පද එකිනෙකට වෙනස්ය. ප්‍රධාන වාක්‍යයේ විය හැකියාව රඳා පවතින්නේ උපවාක්‍යයේ විය හැකියාව මතය.

මෙහිදී ප්‍රධාන වාක්‍යයේ සහ උපවාක්‍යයේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය සාමාන්‍ය රීතියට අනුකූලව යෙදේ. එහෙත් උපවාක්‍යයේ ආඛ්‍යාත පදයේ ඇතැම් විට ස්වර වෙනස්කම් සිදුවේ. ඉහත තෙවන වැකියේ 'හළම්හ' යන පදය 'හළමො' යැයිද, සිව්වන වැකියේ 'කළහ' යන පදය 'කළෝ' යැයිද වෙනස් වී තිබීම මේ පිළිබඳ නිදසුන් වේ. මෙහිදී එම පදවල අග තිබිය යුතු ප්‍රත්‍ය වෙනුවට 'ඕ' ප්‍රත්‍යය යෙදී ඇත.

මෙම වාක්‍යවල අනාගත කාලාර්ථයක් ගැබ්ව පවතී. එහෙත් 'හොත්' යන නිපාතයට පෙර යෙදෙනුයේ අතීත කෘදන්ත රූපයකි. 'නම්' යන නිපාතයට පෙරද බොහෝ විට අතීත කෘදන්ත රූප යෙදෙන අතර ඇතැම් විට වර්තමාන කෘදන්ත රූපද යෙදේ.

'අවමාර්ථයෙහි නිපාත' යනු 'අඩු ගණනේ/යටත් පිරිසෙයින්' යන අර්ථය සහිත නිපාතයයි. 'ද', 'දූ', 'පවා' සහ 'පොවා' යන නිපාත මීට අයත් වේ. මෙම නිපාත යෙදෙනුයේ නාම පදවලට පසුවය. තවද මෙහිදී 'පොවා' යන නිපාතයට පෙර යෙදී ඇත්තේ ආධාර විභක්තියට අයත් නාම පදයි.

උදා:

- "... පක්ෂීන් කෙරෙහි පටන් මහ බඹුන් දක්වා අහස්හි පොවා හසර කරන්නෝ නැත; ...." (24)
- "... එක පැයකුදු එක විනාඩිකාවකුදූ නො යවා හැම කල්හි මැ සමතිස් පැරුම් පුරමින් ...." (36)
- "(සම්‍යක්සම්බුධයන් වහන්සෙ) ... බුදුවන්නට බෝ මැඩ වැඩැ හුන් දවස් පවා තමන් ගෙ අනුභාවයෙන් ... මරහු මුහුණින් වැටී හෙන පරිද්දෙන් නැමී වඳනා වැඳුම් ගත්හ; ...." (77)
- "... අද නුඹ වහන්සෙ ගෙ ශ්‍රී බලා බුදු වන්නට නොපැතූ එක් දූ දිව්‍ය මනුෂ්‍යයෙක් නැතැ ...." (117)

යමක් සැසඳීම සඳහා යෙදෙන නිපාත 'තුලනාර්ථයෙහි නිපාත' නම් වේ. 'වඩා' සහ 'වැඩි' යන නිපාත මේ සඳහා යෙදේ. මෙම නිපාත යෙදෙනුයේ සම්ප්‍රදාන විභක්තියට අයත් නාම පදවලට අනතුරුවය.

උදා:

- "... මෙරට වැඩි උස් පර්වතයක් නැත්තා සේ, මහ පොළොවට වැඩි පළල් අනෙක් වස්තුවක් නැත්තා සේ, ආකාශයට වඩා අනෙක් සිස් තැනක් නැත්තා සේ, ...." (60)
- "... මහ සාගරයට වඩා ගැඹුරු ළිඳෙක් නැත, ...." (240)

'අධිකාර්ථයේ/අතිශයාර්ථයේ නිපාත' යනු බහුලත්වය ප්‍රකාශ කිරීම සඳහා යෙදෙන නිපාතයි. 'ඉතා' යන නිපාතය මීට අයත් වේ. මෙම නිපාත යෙදෙනුයේ නාම පදවලට හෝ නාම විශේෂණවලට පෙරය.

උදා:

- "... ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගෙ සිත් ඉතා වියවුල් කොටැ පියන්නාත් දුටු විරීමි, ...." (138)

- "... ආළවකය, පවනින් බුදුන් සොල්වාපී සෙ ඉතා යහපත, ...." (148)

'ප්‍රමාණාර්ථයේ නිපාත' යනු යම් කිසි ප්‍රමාණයක් දක්වනු ලබන නිපාතයි. 'පමණ', 'සා' ආදී නිපාත මෙම ගණයට අයත් වේ. ප්‍රමාණාර්ථයේ නිපාත යෙදෙනුයේ නාම පදවලට අනතුරුවය.

උදා:

- "... පරසතු රුක වනාහි හාත්පසින් යොදුන් සියයක් පමණ ඇත්තෙ යැ, ...." (53)
- "... නහඹ තල්කඳ සා දියකඳින් කැමැත්තවුන් තෙමා ...." (241)

ඉක්මන් බව දැක්වීම සඳහා යෙදෙන නිපාත 'ශීඝ්‍රාර්ථයේ නිපාත' යනුවෙන් හැඳින්වේ. 'වහා' යන නිපාතය මේ සඳහා යෙදේ.
උදා:

- "... සිතට වැඩි වහා පෙරළෙන දැයක් නැත්තා සේ, ...." (60)
- "... වහා දෙව්ලොවින් බැසැ ශක්‍රයා අවුත් ශ්‍රී පාදය වැඳ සිටි කල්හි ...." (268)

ආශිංසනය කිරීම සඳහා යොදාගනු ලබන නිපාත මෙම ගණයට අයත් වේ. 'වා' නිපාතය හා 'ව'යි' යන්න මේ පිළිබඳ නිදසුන්ය.
උදා:

- "... මෙ මාගෙ මැණියොත් මෙයින් පිටත් හැම සත්හුත් නිදුක් වෙත්වා'යි ...." (15)
- "... මෙසේ වූ දුකෙක් සියලු සතුනට නොවේවා'යි ...." (15)
- "... දෙව්රජ, තට නමස්කාර වේ වා...." (316)
- "... අති නීල වූ ඇස් ඇති වෙම්ව'යි ... උසති දෙවිය යන නමෙක් වෙව'යි ...." (316)

'ආශිර්වාදාර්ථයේ නිපාත' යෙදී ඇත්තේ ක්‍රියා පදවලට පරවය. ආශිර්වාද කිරිමේදී 'ව' සහ 'වා' යන නිපාත දෙකම **බුත්සරණෙහි** යෙදී තිබේ. මෙම ව'යි යන්න විකාශනය වී 'වා' යන්න සැකසී ඇති බව මහාචාර්ය පියසීලි විජේමාන්න මහත්මියගේ අදහසයි. අස්ත්‍යර්ථයේ ආශිර්වාද ක්‍රියා මෙන්ම නිෂේධාර්ථයේ ආශිර්වාද ක්‍රියාද **බුත්සරණෙහි** දැකිය හැකිය. ඉහත දෙවන වැකියෙහි නිෂේධාර්ථයේ ආශිර්වාද ක්‍රියා ඇතුළත් වේ. ඉතිරි සියල්ලෙහි අස්ත්‍යර්ථයේ ආශිර්වාද ක්‍රියා අන්තර්ගත වේ. ආශිර්වාදාත්මක වාක්‍යවල උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය සාමාන්‍ය රීතියට අනුව යෙදී ඇත.

'ශ්‍රැති සූචනාර්ථයේ' නිපාත යනු ඇසූ දෙයක් කීමේදී භාවිත කරන නිපාතයි. 'ල' සහ 'ලු' යන නිපාත මීට නිදසුන් වේ. වාක්‍යාවසානයේ යෙදෙන ශ්‍රැති සූචනාර්ථයේ නිපාත මගින්ද උක්ත ආඛ්‍යාත පද සම්බන්ධයේ කිසිදු වෙනසක් සිදු නොවේ.
උදා:

- "එ වධ කරන පුරුෂයා මහනෙල් මල්පෙති සෙ අත් පා කපාහරි ලු." (14)

- "සොර වාත වේගයෙන් දිවෙන්නෙ ද හඹාගත නො හේ ලු." (64)

යම් සිදුවීමක් සිදුවන කාලය හඟවන නිපාත 'කාලවාචක නිපාත' යනුවෙන් හැඳින්වේ. මෙම ගණයට අයත් වන්නේ 'දූන්', 'ඉක්බිති', 'ඉදින්' ආදී නිපාතයි. 'ඉදින්' යන පදය සහිත වාක්‍යවල උපවාක්‍ය අවසානයේ 'නම්' යන නිපාතය යෙදී තිබෙනු දැකිය හැකිය. පහත දෙවන වැකිය මේ පිළිබඳ නිදසුනකි.

උදා:

- "<u>ඉක්බිති</u> සියලු විශාලා පුරයෙහි භූමිභාගය පාරිශුධ වීයැ." (180)
- "... <u>ඉදින්</u> තට නො බැරි වී නම් අද මෙ එක රැයැ මෙ විමානයෙහි දවස් ගලවම්හ." (137)
- "... පස්වග මහණහු <u>දූන්</u> බරණැස ඉසිපතන විහාරයෙහි වෙසෙති." (239)

යමක් අවධාරණය කිරීම සඳහා යොදනු ලබන නිපාත 'අවධාරණාර්ථයේ නිපාත' නම් වේ. මේ සඳහා යෙදී ඇත්තේ 'ම' නිපාතයයි.

උදා:

- "... දරත් මම් <u>මැ</u> ගෙනෙමි, දියත් මම් <u>මැ</u> ගෙනෙමි, ...." (336, 337)
- "... ගඞ්ගාවෝ ද එහි <u>මැ</u> වදිති, ...." (46)

මෙහිදී අවධාරණය කළ යුතු නාම පදවලට පරව 'මැ' නිපාතය යෙදී ඇත. වර්තමාන ලේඛන ව්‍යවහාරයෙහි මෙය 'ඇ' කාරය රහිතව දක්නට ලැබේ.

'මාතෘකා කිරීමෙහි නිපාත' යනු යමක් පිළිබඳව නැවත විස්තර කිරීමේදී යොදනු ලබන නිපාතයි. 'වූ කලි', 'වනාහි', 'නම්' හා 'කලි' යන නිපාත මේ සඳහා යෙදේ. 'වූ කලි' යන නිපාතය 'කලි' යනුවෙන් ද යෙදී තිබීම මෙම භාෂා රටාවේ විශේෂත්වයකි. පහත සිව්වන සහ පස්වන වැකිය මේ පිළිබඳ නිදසුන් වේ.

උදා:

- "අමාත්‍යයො ... පච්චය <u>නම්</u> ඇළි ඇතු සදා ගෙනාහ." (360)
- "... පරසතු රුක <u>වනාහි</u> හාත්පසින් යොදුන් සියයක් පමණ ඇත්තෙ යැ, ...." (53)
- "සර්‍වඥයන් වහන්සෙ ගෙ දත් <u>වූ කලි</u> සම වැ තිබෙන්නෙ යැ." (255)
- "එ අත්ත <u>කලි</u> මිනිසෙක් නො මඬවයි, ...." (193)
- "... 'ඇපි <u>කලි</u> සියලු සංස්කාර ධර්‍ම ආනාත්ම යැ' යි කියම්හ." (199)

ඇතැම් නිපාත විවිධ අර්ථවලින් වාක්‍ය තුළ යෙදේ. 'හා', 'ද' සහ 'යැ' යන නිපාත මේ පිළිබඳ නිදසුන්ය. මේ අතුරින් 'හා' නිපාතය සහාර්ථයේ, සමුච්චයාර්ථයේ, කාලාර්ථයේ ('සිදුවනවාත් සමඟ' යන අර්ථයෙහි) යෙදේ.

එසේම 'ද' නිපාතය ප්‍රශ්නාර්ථයේ, සමුච්චයාර්ථයේ සහ සම්බන්ධාර්ථයේද, 'යැ' නිපාතය සමුච්චයාර්ථයේ සහ වාක්‍යාවසානයේද භාවිත වේ.

සහාර්ථයේ නිපාත යනු 'එක්ව' යන අර්ථය සහිත නිපාතයි. පහත දැක්වෙන්නේ ඒ පිළිබඳ නිදසුන් කිහිපයකි.

උදා:

- "... අමාත්‍යයො හැම දෙන සමඟ බැණැ ...." (135)
- "... අඥානයන් කැටි වැ තමන් තමන් ගෙ මත කියා නිමවු කල්හි, ...." (169)

'සමඟ' යන අර්ථයෙන් ද්‍රව්‍යාන්තර ප්‍රවෘත්ති සහ පුද්ගලාන්තර ක්‍රියාකාරකම් හඟවන පදවලට පෙර 'හා' නිපාතය යෙදේ. මෙසේ සහාර්ථයෙහි 'හා' නිපාතය භාවිත වන්නේ වාද කිරීම, සටහන් කිරීම, සම්බන්ධ වීම, බෙදාගැනීම, ගිවිසගැනීම, සංවාදයේ යෙදීම, සමාන වීම ආදී දෙපාර්ශ්වයන්ගේ සහභාගීත්වය අවශ්‍ය ක්‍රියාකාරකම් දැක්වෙන ක්‍රියා රූපයන්ට පූර්වයෙනි. (විජේමාන්න, 2006: 178, 179)

උදා:

- "... පූණ්භද්‍ර නම් යක්ෂයා කුරු රට බැසැ ධනඤ්ජය නම් රජහු හා දූ කෙළැ ...." (144)
- "... සඳ මඬුලු හිර මඬුලු හා ස්පර්ධා කරන කදෝපැණියෝ නැත, ...." (240)

'හා' නිපාතයට පෙර යෙදෙන නාම පදය අනුක්ත රූප ගනී. නාම පදවලට පසුව යෙදෙන 'හා' නිපාතයට පරව බොහෝ විට 'සමඟ' යන්න භාවිත වේ. (විජේමාන්න, 2006: 178)

**බුත්සරණෙහි** 'හා' නිපාතයට පරව 'සමඟ' 'කැටි වැ' සහ 'එක් වැ' යන පද යෙදී තිබේ.

උදා:

- "... බුදු වැ සුවිසි අසඞ්ඛ්‍යයක් සතුන් හා කැටි වැ අමා මහ නිවන් වැද නිවී සැනැහී,...." (12)
- "... දෙදෙව්ලොවැ දෙවතාවන් හා සමඟ ශක්‍රදෙවෙන්ද්‍ර ද අවුත් වඩනා පෙරමඟැ රැස්වී යැ, ...." (180)
- "චෙතිය රජ්ජුරුවො දැකැ සතුටු වැ උපසථාන කොටැ සැටදහසක් රජ්ජුරුවන් ගෙනැ සඳමහ රජාණන් හා එක් වැ මැ නික්මුණාහ." (358)

නාම පද දෙකක් හෝ ක්‍රියා රූප දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ කිරීම සඳහා සමුච්චයාර්ථයේ නිපාතයක් වශයෙන්ද 'හා' නිපාතය බහුලව භාවිත වේ. (විජේමාන්න, 2006: 174) **බුත්සරණෙහි** සඳහන් මෙබඳු අවස්ථාවල ඇතැම් විට සම්බන්ධ වන අවසාන නාම පදයට පසුවද 'හා' නිපාතය යෙදී තිබේ. එම නිපාතයට පෙර යෙදී ඇත්තේ අනුක්ත නාම පදයි.

උදා:

- "... දිය හා දර හා නැති වැ ගියෙ." (207)

- "... භෙරිතූර්‍යඝෝෂාදයෙන් හා අසුන් ගෙ හේෂාරවයෙන් හා ඇතුන් ගෙ කුඤ්චනාදයෙන් හා එකනිර්ඝොෂ යැ." (318)

ඇතැම් විට 'හා' නිපාතයෙන් සම්බන්ධ වන නාම පදවලින් ප්‍රකාශ වන දේ සංඛ්‍යාත්මකව පිඩු කර දක්වා ඇත. (විජේමාන්න, 2006: 176)

උදා:

- "... නිගණ්ඨයකු හා නිගණ්ඨියක හා දෙන්නා සියලු ජම්බුද්වීපයෙහි වාද පිණිසැ ඇවිදිනාහු ...." (190)
- "... කුඹ එබූ මැණික හා මුදුනෙ මැණික හා කණ්ඨයෙහි මැණික පිට මැණික හා මෙ සතරමැණික අනඝ යැ ...." (323)

'හා' නිපාතය '...... න්නා' අන්ත වර්තමාන කෘදන්තයන්ට පරව කාලාර්ථයෙහි යෙදේ. මෙය දොළොස්වන සියවසේ සිට බහුලව භාවිත වී ඇත. මෙහිදී 'හා' නිපාතයෙහි ගැබ්ව ඇත්තේ 'සිදුවනවාත් සමඟ' යන අර්ථයයි. (විජේමාන්න, 2006: 179)

උදා:

- "... යටට ඇස හෙළා-ලන්නා හා අවීචිය දක්වා සියලු පෘථිවිමණ්ඩලය එකාඬගණ වැ ගියෙ යැ, ...." (115)
- "... සර්‍වඥයන් වහන්සෙ ගෙ ශ්‍රී පාදය එළිපතට නඟන්නා හා එ විමානයෙහි දෙර තෙමෙ මැ හැරී ගියෙ යැ." (139)

'හා' නිපාතයට පරව අවධාරණවාචී 'මැ' යෙදුණු විට 'වහාම' යන අර්ථය දෙනු ලැබේ. 'ඒ හාම' යන්න පෙර ඇති වැකියකට අර්ථ වශයෙන් සම්බන්ධ වී 'ඒ සමඟම', 'ඒ වහාම' යන අරුත් ගෙන දේ. මෙහිදී 'හා' නිපාතයට පෙර යෙදෙනුයේ වර්තමාන කෘදන්ත පදයි. (විජේමාන්න, 2006:180)

උදා:

- "අනිත් ශ්‍රී පාදය දික්කරන්නා හා මැ එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් මහමෙර නැමී පිළිගත." (113)
- "ස්වාමි දරුවන් ආසනයෙහි වැඩ-හිඳිනා හා මැ ශ්‍රමණ බ්‍රාහ්මණ රාජකුමාරාදී නානාප්‍රකාර වූ පිරිස් බුදුන් පිරිවරා එහි මැ හුන්හ." (184)

කිසියම් පැනයක් නැගීම සඳහා ඉවහල් වන නිපාත 'ප්‍රශ්නාර්ථයේ නිපාත' යනුවෙන් හැඳින්වේ. 'ද' , 'නු' , 'දෙහො' යන නිපාත මේ සඳහා යෙදී ඇත.

උදා:

- "... මහාමායා දෙවීන් වහන්සේගෙ පුතණුවන් වහන්සේ නුඹ වහන්සේ ද?" (66)
- "දරු සනායෙන් මා හඬා විචාරතුදු නො බැණැ මැ වැඩහිඳිනා දැ නු?" (351, 352)

ප්‍රශ්නාර්ථයේ බහුල වශයෙන් යෙදී ඇත්තේ 'ද' නිපාතයයි. මීට අමතරව 'නු' නිපාතයද **බුත්සරණෙහි** විරල වශයෙන් යෙදී ඇත. එහෙත් එය පූර්ණ

ප්‍රශ්නවාචකයක් සේ නොසැලකේ. මෙය වර්තමාන ව්‍යවහාරයේ පවතින 'නෙ' යන්නට සමාන වූවකි. එය පිළිතුරක් අනපේක්ෂිත ප්‍රශ්නයක් සේ යෙදෙන්නකි.

තවද ප්‍රශ්නාර්ථ, විස්මයාර්ථ, කුතුහලාර්ථ හා සංශයාර්ථ ආදී විවිධ අර්ථ දනවීමට 'දෙ හො' යන්නද **බුත්සරණෙහි** යෙදී තිබේ. (විජේමාන්න, 2010: 215)
උදා:

- "... නුඹ වහන්සෙ මෙසෙ කලැ උන් වහන්සෙ කොතරම් දෙ හො! ...." (195)
- "... එ උත්තමයා ළය ගල කෙළෙදෙ හො! ...." (356)

ප්‍රශ්නාර්ථයේ නිපාත පදවලට පෙර නාම පද සහ ක්‍රියා පද යෙදී ඇති බව ඉහත නිදසුන් තුළින් පැහැදිලි වේ.

එක් ක්‍රියා පදයක් යටතේ නාම පද කිහිපයක් සම්බන්ධ කොට දක්වීමේදී භාවිත වන නිපාත 'සමුච්චයාර්ථයේ නිපාත' නම් වේ. 'ද', 'ත්' සහ 'යැ' යන නිපාත සමුච්චයාර්ථයේ යෙදේ.
උදා:

- "එහි බුදුන් වහන්සේ ද පසේබුදුන් වහන්සේ ද රහතුන් වහන්සේ ද නහන සෙයෙකැ, ... එහි දෙවතාවො ද යක්‍ෂයො ද උයන් කෙළි කෙළනාහ." (46)
- "බෝධි සත්ත්වයො ද මද්‍රිදෙවී ද වැඳ ආසන පනවා දී හුන්හ." (359)
- "එ ගමැ බල්ලොත් ගෙරිත් මිනිස්සුත් මහ හඬින් හඬති." (208)

මේ අතුරින් 'ත්' යන නිපාතය යෙදෙනුයේ වචනයත් සමඟමය. මක් නිසාද යත් සාමාන්‍යයෙන් නිපාත වෙන් කළද, හල් අකුරක් එසේ වෙන්ව නොයෙදෙන බැවිනි.

'සම්බන්ධාර්ථයේ නිපාත' යනු කිසියම් සබැඳියාවක් ප්‍රකාශ කරන නිපාතයි. මෙම නිපාත මගින් වාක්‍ය කිහිපයක් සම්බන්ධවීම සිදු වේ. 'යි', 'නම්', 'ද', 'ත්' යන නිපාත මෙම ගණයට අයත්ය. සම්බන්ධාර්ථයේ නිපාතවලට පෙර යෙදී ඇත්තේ නාම පද සහ ක්‍රියා පදයි.
උදා:

- "... ගම්දරුවො 'මෙ අත්ත කා මැඬැවූහ'යි කියමොද"යි විචාළහ." (192)
- "... එ ගමැ බල්ලොත් ගෙරිත් මිනිස්සුත් මහ හඬින් හඬති." (208)
- "... දෙපුතුමවුත් පියාණොත් මළහ, ...." (222)

වාක්‍ය නිමා කිරීමේදී යොදනු ලබන නිපාත 'වාක්‍යාවසාන නිපාත' යනුවෙන් හැඳින්වේ. 'ය', යි, 'යැ', 'දැයැ', 'සේකැ' හා 'සෙයෙකැ' ආදිය මේ පිළිබඳ නිදසුන්ය.
උදා:

- "... එ රජ ... වධ කරන පුරුෂයාට එන්නට කීයැ." (13)
- "... එ යක්ෂ තෙමෙ ... මිනිසා අල්ලා ගෙනැ සල්වසල්වා හඬවහඬවා කයි." (135)

- "... අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහ තෙරුන් වහන්සේ ... විහාරයට වැඩි දැයැ." (69)
- "... බුදුරජාණන් වහන්සෙ එක් සමයෙක්හි ජේතවන මහාවිහාරයෙහි වැඩවසන සේකැ." (134)
- "... සර්වඥයන් වහන්සෙ ... ඇතුන් කෙළදහසකට බල ඇති සෙයෙකැ." (262)

වර්තමාන ලේඛන ව්‍යවහාරයෙහි පවතින 'ය', 'හ', 'සේක', 'දැය' යන වාක්‍යාවසාන නිපාත 'ඇ' කාර සහිතව **බුත්සරණෙහි** බොහෝ විට දක්නට ලැබේ. 'හ' නිපාතය 'ඇ' කාරය රහිතවද ඇතැම් විට යෙදී තිබේ. තවද වර්තමානයේ භාවිත වන 'යි' යන නිපාතය **බුත්සරණෙහි** එලෙසින්ම දැකිය හැකිය. 'සේකැ', 'සෙයෙකැ' යන ගෞරවාර්ථ නිපාත යෙදී ඇත්තේ 'වහන්සේ' වැනි ගෞරවර්ථ නාම පද උක්ත වූ විටය.

ඇතැම් නිපාත යෙදෙනුයේ වාක්‍ය ආරම්භයේය. ඒවා හැඳින්වෙනුයේ පූර්ව නිපාත යනුවෙනි. මෙම නිපාත හා වාක්‍යයේ සෙසු කොටස් අතර වාක්‍ය විචාරාත්මක සම්බන්ධතාවක් නොමැත.

වාක්‍ය තුළ වඩාත් පරිපූර්ණ බවක් ඇති කිරීම සඳහා යොදනු ලබන නිපාත 'පූර්ණාර්ථයේ නිපාත' නම් වේ. මෙම නිපාත තුළින් සමීප වාක්‍ය හෝ ඡේද අතර සම්බන්ධතාව වැඩි දියුණු කෙරේ.

උදා:

- "මෙසෙ දෙළොස් හවුරුද්දෙක් ඉක්මැ ගියේ යැ." (135)
- "එසෙ මැ නානාප්‍රකාරවර්ණකම්බල අතුළා වූ, නඟන ලද ධවජ පතාකා ඇති ... නොයෙක් රථයෙහි චක්‍රනාදයෙන් නිරන්තර යැ." (162)
- "තව ද සර්වඥයන් වහන්සෙ දශබලයක් ඇති සේකැ." (261)

යමකු ඇමතීම සඳහා යොදනු ලබන නිපාත 'ආමන්ත්‍රණාර්ථයේ නිපාත' යනුවෙන් හැඳින්වේ. 'හම්බල' 'හෙම්බල' 'එම්බල' 'කොළ' සහ 'බල' යන නිපාත මේ සඳහා යෙදේ. මේ අතුරින් 'හෙම්බල', 'කොළ' යන නිපාත බොහෝ විට යෙදී ඇත්තේ කෝපය හැඟවීමේදීය.

උදා:

- "... හම්බල තෙල කප්රුක් මුලැ හැලීහුන්නවු යැ, 'හෙම්බල! තෙල විමානයෙහි හුන්නවු යැ ...." (210)
- "එම්බල, තට උපායක් කියමි; ...." (337)
- "... කොල! දුෂ්ට තීක්ෂ්ණකයෙනි, තෙපි හැම ... යොත්නක් පමණ තැනැ එක්පෙති දෙපෙති අඟ පැළ පවා උදුරා-දම්මාපුව." (103)
- "... බල, තා ගෙ අතවැස්සන් ගෙත් අභිප්‍රාය දන එ'යි යවා වදාළ සේකැ." (132)

මානසිකව ඇති වන සිතිවිලි, ආවේග ආදී මනෝභාවයන් ප්‍රකාශයට පත් කරන නිපාත 'භාවාර්ථයේ නිපාත' නම් වේ. 'අනේ', 'අහා' සහ 'ඔහෝ' ආදී නිපාත මේ සඳහා යෙදේ.
උදා:

- "... අනේ! නගඬ කුම් කරමො ද ...." (345)
- "... අහ වැළැකැ යා, අහා!! වැළැකැ යා, අප ගෙ බුදුරජාණන් වහන්සෙ හැරැපිය හැරැපිය, ...." (148)
- "... ඔහෝ! මම මෙ තැනැ සිටියෙමි ...." (308)

කාලාර්ථයේ නිපාතයක් වන 'ඉක්බිති' යන්නද පූර්ව නිපාතයක් සේ සැලකිය හැකිය. මෙම නිපාත හා වාක්‍යයේ සෙසු කොටස් අතර වාග්විද්‍යාත්මක සම්බන්ධතාවක් නොමැත.

උදා:

- "ඉක්බිති නාග රාජ තෙමෙ ... ශරීරයෙන් ගිනි කඳ හරන්නට වන." (89)
- "ඉක්බිති බුදුන් වහන්සෙ ද රජගහනුවර පිඬුසිඟා නික්මැ වදළ සේකැ." (97)
- "ඉක්බිති බොධිසත්ත්වයන් ගෙ මැණියො මහත් පෙරහරින් පන්සලට වන්හ." (359)

ඇතැම් නිපාත ඉහත සඳහන් නිපාත මෙන් නිශ්චිත වශයෙන් වර්ගීකරණය කොට දැක්විය නොහැකිය.

යමක් සිදුවූ හෝ සිදුවන ආකාරය දක්වීම සඳහා 'පරිදි' යන නිපාතය යෙදේ. මෙම නිපාතයට පෙර යෙදෙනුයේ කෘදන්ත පදයකි.
උදා:

- "... සියලු ලොව ශාන්ති කළ පරිදි කියා නිමවත් ...." (134)
- "... අප කී පරිදි නුවණින් පරීක්ෂා කොටැ පියා ...." (154)
- "තොප මා හඳුනන පරිදි කෙසෙ ද ...." (206)

'සැම' යන අර්ථයෙන් 'පතා' යන නිපාතය භාවිත වේ. මෙම නිපාතයට පෙර යෙදෙනුයේ නාම පදයකි.
උදා:

- "... දවස් පතා තට මිනිසකු හා බත් පයක් හා බලිකම්මාන්ත කොටැ දෙමි, ...." (135)

යමක් සිදු කරනු ලබන වාර ගණන දක්වීම සඳහා 'බැගින්' යන නිපාතය යොදනු ලැබේ.
උදා:

- "... බුදුන් වහන්සෙට සේසත් මත්තෙහි සේසත් බැගින් දෙ සේසතක් ධරා ...." (177)

- "... තෙසු පරිවාර භික්ෂූන් වහන්සෙ කෙරෙන් එකි එකි වහන්සෙ කෙනෙකුන්දැට කුඩ මත්තෙහි කුඩ දෙක බැගින් මෙසෙ පූජා සරහාගෙනැ ...." (178)
- "... මෙසෙ එකි එකි දෙයින් සත්සියක් සත්සියක් බැගින් දන් දී ...." (327)

'බැගින්' යන නිපාතයට පෙර බොහෝ විට යෙදෙනුයේ සංඛ්‍යාවාචී නාම පදය. එහෙත් ඇතැම් විට එම නිපාතයට පෙර නාම පදද යෙදෙන බව මෙහි දෙවන වැකියෙන් පැහැදිලි වේ.

**බුත්සරණෙහි** 'නමුත්' යන නිපාතය යෙදී ඇත්තේ වර්තමානයේ මෙන් 'එසේ වුවත්' යන අර්ථයෙන් නොව අසම්භාව්‍ය අර්ථයෙන් හා අවධාරණාර්ථයෙනි.

උදා:

- "... ශ්‍රමණගෞතමයන් ගෙ ශ්‍රාවකයො තමන් දිවියෙ නමුත් ශික්ෂාපද නො ඉක්මෙති." (98)
- "සත්පුරුෂයන් විසින් පූජා කටයුත්තෙම් නමුත් මම් මැ යැ, දිවි ලද්දෙහි එල ලද්දෙම් නමුත් මම් මැ යැ, සංසාර දුක් දිනුයෙම් නමුත් මම් මැ යැ; ...." (132)

යථෝක්ත පළමු වැකියේ අන්තර්ගත 'දිවියෙ නමුත්' යන්නෙහි අදහස 'දිවියතත්' යන්නයි. එහි ඇත්තේ අසම්භාව්‍ය අර්ථයයි. දෙවන වැකියෙහි 'කටයුත්තෙම් නමුත්', 'ලද්දෙහි නමුත්', 'දිනුයෙම් නමුත්' ආදියෙහි ගැබ්ව ඇත්තේ පිළිවෙළින් 'කළයුත්තෙත්', 'ලද්දෙත්', 'දිනුයෙත්' යන අදහස්ය. එම පදවල ගැබ්ව ඇත්තේ අවධාරණාර්ථයයි.

**බුත්සරණෙහි** එක් අර්ථයක් සහිත නිපාත මෙන්ම විවිධ අර්ථ සහිත නිපාතද දක්නට ලැබේ. මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගත නිපාත බොහොමයක් වර්තමානයේද එම අර්ථවලින්ම භාවිත වේ. එහෙත් 'නමුත්' යන නිපාතය **බුත්සරණේ** යෙදී ඇත්තේ අවධාරණාර්ථයේ හා අසම්භාව්‍ය අර්ථයෙහි වුවද, එය වර්තමානයේ භාවිත වන්නේ තථාභූතාර්ථයෙහිය (එනම් 'එසේ වුවත්' යන අර්ථයෙනි). තවද 'නිසා' යන නිපාතය වර්තමානයේ මෙන් සාධකාර්ථයෙහි මෙන්ම 'ඇසුරුකොටගෙන' යන අර්ථයෙන්ද **බුත්සරණෙහි** දක්නට ලැබේ. මීට අමතරව වර්තමානයේ භාවිත නොවන 'කොල', 'හම්බල', 'හෙම්බල' වැනි ආමන්ත්‍රණාර්ථයේ නිපාත හා 'පොවා' යන අවමාර්ථයේ නිපාතයද **බුත්සරණෙහි** ඇතුළත් වේ. සමස්තයක් වශයෙන් ගත් විට **බුත්සරණින්** නාවරණය වන්නේ මේ වන විට සිංහල භාෂාවේ නිපාත සියල්ලම පාහේ තහවුරු වී තිබූ බවයි.

### *නිගමනය*

දොළොස්වන දහතුන්වන සියවස්වල භාවිතයේ පැවති ඇතැම් නිපාත හා නිපාතවල අර්ථ පසු කාලයේදී අභාවයට ගොස් ඇත. සමස්තයක් වශයෙන් ගත් විට **බුත්සරණින්** අනාවරණය වන්නේ මේ වන විට සිංහල භාෂාවේ නිපාත සියල්ලම පාහේ තහවුරු වී තිබූ බවයි.

## *උපකාරානුස්මෘති*

මෙම පර්යේෂණය සඳහා මාර්ගෝපදේශකත්වය සැපයූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය පියසීලි විජේමාන්න මහත්මියටත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය දර්ශනී ගුණතිලක මහත්මියටත් මාගේ කෘතවේදීත්වය පළ කර සිටිමි.

## *ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය*

*කරුණාතිලක, ඩබ්. එස්. (2003) සිංහල භාෂා ව්‍යාකරණය, කොළඹ, සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.*

*කුමාරතුංග, මුනිදාස සහ ගුණවඩු, අමරසිරි. (1965) සිදත් සඟරා විවරණය, කොළඹ: කේ. ඒ. ආරියදස සහ සමාගම.*

*විජේමාන්න, පියසීලි. (2006) ප්‍රණාම - මහාචාර්ය නන්දසේන මුදියන්සේ අභිනන්දන,"පැරණි සිංහලයේ 'සහ' 'හා' නිපාත යෝගය" සංස්. ගාමිණී දැළ බණ්ඩාර කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 178, 179.*

____ *(2010) ආචාර්ය වැලමිටියාවේ ශ්‍රී කුසලධම්මනාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, "12 වන ශතවර්ෂයෙහි සිංහල භාෂාවේ ස්වරූපය" සංස්. මහින්ද සංඝරක්ඛිත හිමි සහ තවත් අය කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 215.*

____*(1984), Amavatura-A Syntactical Study" Colombo: Lake House Printers and Publishers Ltd.*